**තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**--------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ **1.3** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබී තිබුණු පිරිවැය රු. 12,698,000 ක් වූ කොම්පැක්ටර් රථයෙහි සහ පිරිවැය රු. 204,640 ක් වූ පරිගණක හා උපාංගවල වටිනාකම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය යුතු එකතුව රු. 3,996,463 ක් වූ වියදම් සහ එකතුව රු. 336,955 ක් වූ කර්මාන්ත සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ඉටුකර තිබූ කර්මාන්ත 04 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන රු. 265,192 ක් අඩුවෙන් සලසා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ආයුර්වේද බෙහෙත් ශාලා, ඖෂධ තොග වටිනාකම රු. 231,379 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන ඇතිකර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ඉතිරි තොගය තුළ පැවති උපකරණ අයිතම 103 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණු අතර, ලිපි ද්‍රව්‍ය හා වීඊ පහන් කට්ටලවල වටිනාකම රු. 52,138 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

**--------------------------**

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 19 ක ශේෂයන් සහ ඊට අදාළ පොත්පත් හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු. 13,802,739 ක් විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම්**

**------------------**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ අවිනිශ්චිත ගිණුමේ ඇතුළත් වූ රු. 272,262 ක හර ශේෂය නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-----------------------------------**

(අ) ලැබිය යුතු ගිණුම්

------------------

දීර්ඝ කාලයක සිට අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. 13,984,384 ක් වූ හිඟ හිටි ආදායම් ශේෂ පැවතුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

--------------------

දීර්ඝ කාලයක සිට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුව ඇති රු. 3,459,027 ක් වූ දායක මුදල්, එකතුව රු. 475,225 ක් වූ එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු මුදල් සහ සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු. 24,473,557 ක් වූ වියදම් හා කර්මාන්ත ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**----------------------------------------------**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 36,150,004 ක් වූ ගිණුම් විෂයයන් 12 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.6 අනුකූල නොවීම්**

**-----------------**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

----------------------------------------------------------------------

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම (රු.) | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 95 වගන්තිය | | ගලි රථ මගින් බැහැර කරන මළ අපද්‍රව්‍ය යාල වනෝද්‍යාන මායිමේ වූ විවෘත පරිසරයට මුදා හරින බව නිරීක්ෂණය විය. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| (i) රීති 14 (1) හා (2) | 10,705,750 | අයවැයගත ප්‍රතිපාදනය ඉක්මවා ප්‍රාග්ධන වියදම් දරා තිබුණි. |
| (ii) රීති අංක 185 | - | ප්‍රාදේශීය සභා ඉතුරුම් ගිණුමේ හා පොදු ගිණුමේ පැවති අතිරික්ත මුදල් ශේෂ ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) රීති අංක 193 | - | අයවැයගත ප්‍රතිපාදන හා පරිපූරක සම්මත සමඟ සසඳා එක් එක් ආදායම් විෂයයන් යටතේ වන අතිරික්තයන් හෝ ඌනතාවයන් පිළිබඳ කරුණු පැහැදිලි කරන ප්‍රකාශයක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) මුදල් රෙගුලාසි 103 (1)(ආ), 104(1), (3),(4) | 730,355 | කැබ් රථ දෙකකට, ගාබේජ් කම්පැක්ටරයට සහ ට්‍රැක්ටර් රථයට සිදු වූ අනතුරු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 189 | 346,184 | අගරු චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | සභාව සතු වාහන 11 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඉ) 2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 දරන විදුලිබල හා බල ශක්ති අමාත්‍යාංශයේ චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවීම නිසා සභා අරමුදලින් නඩත්තු කරන වීථි පහන් 1852 න් 1656 ක් සඳහා ගාස්තු ප්‍රතිපූර්ණය කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම, රු.4,892,629 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,023,232 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

---------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදලේ ශේෂය රු. 47,336,896 ක සෘණ අගයක් ගෙන තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i වරිපනම් හා බදු | 2,820,000 | 2,963,492 | 3,100,407 | 3,252,567 | 2,303,537 | 2,834,159 | 3,456,654 | 3,409,398 |
| ii කුලී | 9,622,700 | 10,145,003 | 10,717,314 | 1,089,089 | 9,934,536 | 9,366,741 | 9,476,001 | 1,421,500 |
| iii බලපත්‍ර ගාස්තු | 13,061,500 | 14,720,225 | 15,087,881 | 336,423 | 11,830,500 | 13,306,732 | 12,514,982 | 795,900 |
| iv වෙනත් ආදායම් | 23,379,400 | 14,509,692 | 12,877,398 | 18,214,481 | 18,205,696 | 22,009,899 | 14,559,822 | 16,499,648 |
| එකතුව | 48,883,600 | 42,338,412 | 41,783,000 | 22,892,560 | 42,274,269 | 47,517,531 | 40,007,459 | 22,126,446 |

**2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**----------------------------------**

සමාලෝචිත වර්ෂයට බිල්කළ මුළු ආදායම රු. 42,338,412 ක් වූ අතර,වර්ෂය තුළ රු. 41,783,000 ක් රැස්කර තිබුණි. ඉකුත් වර්ෂය අවසානයට රු. 22,126,446 ක් ව පැවති හිඟ ආදායම සමාලෝචිත වර්ෂය අවසානයට රු. 22,892,560 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**2.3.3 වරිපනම්**

**---------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු. 2,874,227 ක් වූ හිඟ වරිපනම් බදු ශේෂයෙන් රු. 10,000 කට වැඩි හිඟ ශේෂයක් සහිත ඒකක 20 කින් එකතුව රු. 459,051 ක් අයවිය යුතුව පැවති අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) වගන්තිය ප්‍රකාරව හිඟ බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2007 වර්ෂයේ දේපල තක්සේරුව මත පදනම්ව සමාලෝචිත වර්ෂය සඳහා ද වරිපනම් බදු අයකර තිබුණි.

**2.3.4 කුලී**

**----**

කඩ කාමර කුලී

------------------

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟව පැවති රු. 587,057 ක් වූ කඩ කාමර කුලී අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 05 ඡේදයට අනුව සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළ යුතු වුවත්, සභාව සතු කඩ කාමර සම්බන්ධයෙන් ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) උක්ත චක්‍රලේඛයේ 03 ඡේදයට අනුව නව තක්සේරු බදු කුලිය සභා සම්මත කර ගෙන අයකිරීමට කටයුතු නොකිරීම නිසා සභා අරමුදලට රු. 8,771,048 ක කුලී මුදලක් අහිමි වී තිබුණි.

(ඈ) උක්ත චක්‍රලේඛයේ 11 ඡේදයට අනුව සභාවේ අනුමැතියකින් තොරව වෙනත් පාර්ශවයක් වෙත බදු අයිතිය පැවරීම සිදු නොකළ යුතු වුවත්, රු. 5,000 සිට රු. 30,000 දක්වා පරාසයක වූ මාසික කුලී මුදල් මත කඩ කාමර අතුරු බදු දී තිබුණු බව 2018 පෙබරවාරි 16 දින සිදු කළ ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඉ) සභාවට අයත් කඩ කාමර 28 ක් සඳහා බිල් කිරීම් දීර්ඝ කාලයක සිට නතර කර තිබූ අතර, ඉන් මාළු වෙළඳ පොළ බිල් කිරීම 2012 සැප්තැම්බර් මාසයේ නතර කරන අවස්ථාව වන විටත් හිඟව පැවති රු. 335,811 ක කුලියෙන් 2018 පෙබරවාරි 16 දින වන විටත් අයකර ගෙන තිබුණේ රු. 28,161 ක් පමණි.

**2.3.5 බලපත්‍ර ගාස්තු**

----------------

සභාව විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149,150 සහ 152 වගන්ති ප්‍රකාර බලපත්‍ර ගාස්තු අය නොකිරීම නිසා 2017 දෙසැම්බර් 31 දිනට රු. 336,423 ක් අයවිය යුතුව පැවතුණු අතර, බදු ගෙවීම පැහැර හැරි පාර්ශවයන් සම්බන්ධයෙන් එකී විධිවිධාන අනුව ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

**2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ උසාවි දඩ රු. 3,578,222 ක් සහ මුද්දර ගාස්තු රු. 13,930,567 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්යසාධනය**

---------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ සභාව විසින් ඉටු කළ යුතු මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාත්මක නොකළ කර්මාන්ත

------------------------------------

(i) ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග කි.මී. 1000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ කර්මාන්ත 02 ක ඉදි කිරීම් කටයුතු ආරම්භ නොකර, මුදල් වෙන් කර ගැනීම සඳහා පමණක් බිල්පත් සකස් කර ඉදිරිපත් කිරීම නිසා, ගෙවීම් නොකරන බව දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස් විසින් දන්වා තිබුණි. ඒ හේතුවෙන් සභා බල ප්‍රදේශයට රු. 2,000,000 ක වටිනාකමකින් යුතු සංවර්ධන ප්‍රතිලාභ අහිමි වී තිබුණි.

(ii) 2017 අයවැය ලේඛනයට හා ක්‍රියාකාරී සැලැස්මට අනුව සංවර්ධනය කිරීමට අපේක්ෂිතව තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු. 2,580,000 ක් වූ මාර්ග 24 ක් සංවර්ධනය කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සහ අරමුදලින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතව තිබූ ඇස්තමේන්තුගත වටිනාකම පිළිවෙලින් රු. 225,000 ක් සහ රු. 300,000 ක් වූ ආයුර්වේද වැසිකිළිය හා නාන කාමරය ඉදි කිරීම සහ දෙබරවැව සුසාන භූමිය වටා වැට ඉදි කිරීමේ ව්‍යාපෘති වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) සන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සභාව සතුව හෙක්ටයාර 4.6122 ක භූමි ප්‍රමාණයකින් යුත් කසළ කළමනාකරණ මධ්‍යස්ථානයක් පැවතියද, දෛනිකව රැස්කරන කසළ තොගයෙන් ටොන් 6 - 8 ත් අතර ප්‍රමාණයක් වෙන් කිරීමෙන් තොරව අවිධිමත් ආකාරයට යාල වනෝද්‍යාන මායිමේ පිහිටි අක්කර 10 ක පමණ භූමි ප්‍රදේශයට බැහැර කර තිබුණි. මෙම කැලි කසළ ආහාරයට ගැනීම තුළින් වන සතුන්ගේ ජීවිත අවධානමකට ලක්ව තිබුණි.

(ii) භූමි ප්‍රදේශය තුළ වර්ෂ ගණනාවක සිට රැස් කර තිබූ කසළ තොගයෙන් කොටසක් පස් තට්ටුවකින් ආවරණය කර තිබූ නමුත්, දෛනිකව රැස් කරන කසළ නැවත නැවතත් මෙම භූමියට මුදා හැරීම තුළින් පරිසරයට හා ස්වභාව සෞන්දර්යට අහිතකර බලපෑම් එල්ල වී තිබුණි.

(iii) මධ්‍යම පරිසර අධිකාරියෙන් නිකුත් කරන ලද අංක SU-B 01316 (RI) දරන පාරිසරික බලපත්‍රයේ 04 වගන්තියට අනුව කර්මාන්ත භූමිය තුළ ප්‍රමාණවත් ගිණි නිවීමේ උපකරණ හා පහසුකම් ස්ථාපිත කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

---------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

**--------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 09 කට අදාළව, 20 දෙනෙකුගේ අතිරික්තයක් සහ තනතුරු 16 කට අදාළව 38 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.

(ආ) සභාවේ සේවය කරන නිලධාරීන් 12 දෙනෙකු ඔවුන්ගේ නියමිත තනතුරුවල රාජකාරීවල නොයොදවා වෙනත් රාජකාරීවල යොදවා තිබුණි.

(ඇ) සභාවේ සේවයේ යෙදී සිට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 211,075 ක ණය ශේෂ සහ සේවයෙන් පහ කරන ලද, ඉවත්ව ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 207,061 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.3 වත්කම් කළමනාකරණය

-----------------------------

### 3.3.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

---------------------------------------------

2005 වර්ෂයේදී රු. 5,807,500 ක පිරිවැයක් දරා මිලට ගෙන 2013 වර්ෂයේදී හෝ ඊට ආසන්න කාලයකදී අලුත්වැඩියා කටයුත්තක් සඳහා පෞද්ගලික ගරාජයකට භාර දී තිබූ බැකෝ ලෝඩරයක් 2018 පෙබරවාරි 19 දින දක්වාම කිසිදු අලුත්වැඩියාවක් සිදු නොකර ගරාජ භූමිය තුළ දිරාපත් වෙමින් පවතින නමුත්, ගත වූ වර්ෂ 05 ක කාලය තුළ සභාව විසින් මේ සම්බන්ධව කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

### 3.3.2 පවරා නොගත් වත්කම්

--------------------------

සභාව විසින් භාවිතයට ගනු ලබන වාහන 19 ක ලියාපදිංචි අයිතිය 2018 පෙබරවාරි 19 දින වන විටත් සභාව වෙත පවරා ගෙන නොතිබුණි.

### 3.3.3 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

------------------------------------

සභාව සතු ට්‍රැක්ටර් රථ 03 ක්, ජල බවුසරයක්, ජීප් රථයක්, බෝට්ටු දෙකක්, මහන මැෂින් 29 ක්, ජෙනරේටරයක් සහ කුට්ටිගල් සැකසීමේ යන්ත්‍රය දීර්ඝ කාලයක සිට නිෂ්ක්‍රීයව පවතින නමුත්, එම වත්කම් අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 3.3.4 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ

---------------------------

2016 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මගින් සභාවේ වත්කම් සම්බන්ධයෙන් ලබාදී තිබුණු නිර්දේශ පහක් 2018 පෙබරවාරි 16 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

### 3.3.5 වාහන උපයෝජනය

----------------------

සභාව සතු කැබ් රථයකට නව එන්ජිමක් සවිකර තිබුණද, රථයේ ලියාපදිංචි තොරතුරු නීත්‍යානුකූලව සංශෝධනය කරවා ගෙන නොතිබුණි.

### 3.4 හඳුනාගත් පාඩු

-----------------

සභාවේ ට්‍රැක්ටරයකට 2017 ජනවාරි 09 දින සිදුවී තිබුණු අනතුරට අදාළව රක්ෂණ හිමිකම් පෑම, අනතුර සිදුවී මාස තුනක් ඇතුළත ඉදිරිපත් කර නොතිබූ බැවින් රක්ෂණ ආයතනය විසින් රු. 39,915 ක මුදල ගෙවීමට ප්‍රතික්ෂේප කර තිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

### 4.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයයන් 04 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 15,738,343 ක් වූ අතර, එම වටිනාකම්වල ප්‍රතිශතය සියයට 08 සිට සියයට 58 ක් දක්වා පරාසයක විය.

(ආ) වියදම් විෂයයන් 07 ක ඉතිරිකිරීම් වල එකතුව රු. 14,980,758 ක් වූ අතර, එම වටිනාකම්වල ප්‍රතිශතය සියයට 04 සිට සියයට 57 දක්වා පරාසයක විය.

(ඇ) ප්‍රාග්ධන වියදම් විෂයයෙහි අහිතකර විචලනය රු. 10,705,750 ක් වූ අතර, එම වටිනාකමේ ප්‍රතිශතය 124 ක් විය.

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව කාර්තුවකට 01 බැගින් වාර්ෂිකව විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා කමිටු රැස්වීම් 01 ක් පමණක් පවත්වා තිබුණි.

**5. පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ගිණුම්කරණය | i. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් සහ අදාළ උපයෝගී ලේඛනවල දැක්වුණු වටිනාකම් අතර වෙනස්කම් පැවතීම. |
| | ii. ගිණුම් තැබීමේ අඩුපාඩු නිසා ඉකුත් වර්ෂ වෙනුවෙන් සැලකිය යුතු අගයන්ගෙන් ගැලපීම් කිරීමට සිදුවී තිබීම. |
| | iii. අවිනිශ්චිත ගිණුම් ශේෂය නිරවුල් නොකිරීම. |

(ආ) ආදායම් පරිපාලනය

i. හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කර නොතිබීම.

ii. නව ආදායම් උත්පාදන මාර්ග හඳුනා නොගැනීම.

iii. ගිවිසුම් යාවත්කාලීන නොකර හා විධිමත් තක්සේරුවක් නොමැතිව කඩ කාමර බදු දී තිබීම.

iv. තක්සේරු කුලිය අය නොකරන සහ බිල් නොකරන කඩ කාමර පැවතීම.

(ඇ) සේවක කළමනාකරණය

i. පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්තතා විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබීම.

ii. තනතුරු වලට අදාළ රාජකාරිවල නොයොදා වෙනත් රාජකාරි පවරා තිබූ අවස්ථා පැවතීම.

(ඈ) අයවැය පාලනය

i. අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් විෂයයන් අතර සැලකිය යුතු විචලනයන් පැවතීම.

ii. අයවැයගත ඉලක්ක සම්පූර්ණ කර ගැනීමට ඇගයීම් සහ පසුවිපරම් නොකිරීම.